සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 9 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ............................................................................................ විභාග අංකය :- ...........................

**සැලකිය යුතුයි:**

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුරකට ලකුණු 02 බැගින් 40 කි.
- පහත සඳහන් ඒ ඒ ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

Department of Education – Western Province

(01) සම්බුද්ධ පරිනිර්වාණය සිදු වූයේ,
(1) පාවා නුවරදී ය. (2) කුසිනාරා නුවරදී ය.
(3) විශාලා මහනුවරදී ය. (4) සැවැත්නුවරදී ය.

(02) තථාගත බුදුරජාණන් වහන්සේ සෝපාදිසේස පරිනිබ්බාන ධාතුවට පත් වූයේ,
(1) තිස්වන වියේදී ය. (2) තිස්පස්වන වියේදී ය.
(3) අසූවන වියේදී ය. (4) අසූපස්වන වියේදී ය.

(03) බෞද්ධයකු විසින් දැක සංවේගය උපදවා ගතයුතු ස්ථාන හතරක් පිළිබඳව සම්බුද්ධ දේශනාවෙහි සඳහන් වෙයි. ඉන් එක් ස්ථානයක් වනුයේ,
(1) සැවැත්නුවර ජේතවනාරාමයයි. (2) රජගහනුවර වේළුවනාරාමයයි.
(3) බරණැස්නුවර ඉසිපතනාරාමයයි. (4) පැළලුප් නුවර අශෝකාරාමයයි.

(04) තම ශ්‍රාවක පිරිසගේ දක්ෂතා හා ප්‍රවීණතා හඳුනාගෙන ඒ අනුව තනතුරු ලබාදුන් බුදුරජාණන් වහන්සේ ප්‍රඥාවන්තයින් අතර අග තනතුර පිරිනැමූයේ,
(1) සැරියුත් තෙරුන් වහන්සේට ය. (2) මුගලන් තෙරුන් වහන්සේට ය.
(3) මහා කාශ්‍යප තෙරුන් වහන්සේට ය. (4) ආනන්ද තෙරුන් වහන්සේට ය.

(05) නිතර නිතර පුරුද්දක් මෙන් කරනු ලබන කුසලාකුසල කර්ම අයත් වනුයේ,
(1) ගරුක කර්මයන්ට ය. (2) ආසන්න කර්මයන්ට ය.
(3) ආචින්න කර්මයන්ට ය. (4) කටත්තා කර්මයන්ට ය.

(06) කෙලෙස් නැමති ගිනි සම්පූර්ණයෙන්ම නිවී සියලු දුක් නිමා වීම ක්ලේශ පරිනිර්වාණයයි. ඒ පිළිබඳව සඳහන් වන ආර්ය සත්‍ය වනුයේ,
(1) දුක්ඛ ආර්ය සත්‍යයයි. (2) දුක්ඛ සමුදය ආර්ය සත්‍යයයි.
(3) දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යයයි. (4) දුක්ඛ නිරෝධ ගාමිණි පටිපදා ආර්ය සත්‍යයයි.

(07) බුදුරජාණන් වහන්සේ ''කලහ විවාද' සූත්‍රය දේශනා කර වදාළේ,

(1) කොසඹෑනුවර ධර්මධර හා විනයධර භික්ෂූන් වහන්සේලා උදෙසා ය.

(2) යුදවැදීමට ගිය ශාක්‍ය කෝලිය දෙපිරිස උදෙසා ය.

(3) ඡන්න භික්ෂුව සංවර කිරීම උදෙසා ය.

(4) චූලෝදර මහෝදර නාග ගෝත්‍රික පිරිස උදෙසා ය.

(08) භික්ෂුණී ශාසනය පිහිටුවීමෙහි ලා පුරෝගාමී මෙහෙයක් ඉටුකරනු ලැබුයේ,

(1) ආනන්ද තෙරුන් වහන්සේ ය.
(2) අනුරුද්ධ තෙරුන් වහන්සේ ය.
(3) අස්සජි තෙරුන් වහන්සේ ය.
(4) නන්ද තෙරුන් වහන්සේ ය.

(09) බුදුරජාණන් වහන්සේ විසින් මහා ප්‍රජාපතී ගෝතමිය ඇතුළු කාන්තාවන්ට පැවිද්ද හා උපසම්පදාව ලබා දීමේදී පිළිගත යුතු යැයි පනවා වදාළ ධර්මයන් වූයේ,

(1) සත්තිස් බෝධි පාක්ෂික ධර්මයන් ය.

(2) සප්ත අපරිහානි ධර්මයන් ය.

(3) අෂ්ටලෝක ධර්මයන් ය.

(4) අෂ්ට ගරු ධර්මයන් ය.

Department of Education – Western Province

(10) බුදුරජාණන්වහන්සේ, භෝග විනාශයට හේතුවන කරුණු සයක් පිළිබඳව හඳුන්වා දෙනු ලබන්නේ,

(1) උපාලි ගෘහපතියාට ය.
(2) සිගාලක ගෘහ පතියාට ය.
(3) ඡත්ත මානවකයාට ය.
(4) දීඝජානු කෝලිය පුත්‍රයාට ය.

(11) රටක නීතිය සාමය හා සදාචාරය රැකීමට ඉවහල් වන රාජ්‍ය පාලන ප්‍රතිපත්ති අතර ''කාන්තාවන්ට හිරිහැර නොකළ යුතුයි'' යන කරුණ ඇතුලත් වනුයේ,

(1) දස සක්විතිවත් වල ය.
(2) දසරාජ ධර්ම වල ය.
(3) සතර සංග්‍රහ වස්තු වල ය.
(4) සප්ත අපරිහානි ධර්ම වල ය.

(12) කුලවාදයේ ඇති නිරර්ථක බව පෙන්වා දීමට බුදුරජාණන් වහන්සේ දේශනා කළ සූත්‍ර දේශනාවකි,

(1) අග්ගඤ්ඤ සූත්‍රය.
(2) වාසෙට්ඨ සූත්‍රය.
(3) දුප්පත්තිකාර සූත්‍රය.
(4) වේළුද්වාර සූත්‍රය.

(13) මෙලොව පරලොව දියුණුවට අදාල ධර්මෝපදේශ රැසක් ලබාදෙන ''ලෝවැඩ සඟරාව'' නම් වූ පද්‍ය ග්‍රන්ථය රචනා කරන ලද්දේ,

(1) වීදාගම මහා මෛත්‍රෙය හිමි ය.
(2) තොටගමුවේ ශ්‍රී රාහුල හිමි ය.
(3) වැලිවිට ශ්‍රි සරණංකර හිමි ය.
(4) හික්කඩුවේ ශ්‍රි සුමංගල හිමි ය.

(14) සිංහල සාහිත්‍යයේ පළමු මහා කාව්‍ය ලෙස සැළකෙන, දෙවැනි පැරකුම්බා රජු විසින් කුස ජාතකය විචිත්‍ර අයුරින් කාව්‍යයට නගමින් රචනා කළ කාව්‍ය ග්‍රන්ථය වනුයේ,

(1) මුව දෙව්දාවතයි.
(2) කව් සිළුමිණයි.
(3) කාව්‍යශේඛරයයි.
(4) සද්ධර්මාලංකාරයයි.

(15) ශාසන ඉතිහාසයේ සඳහන් වන බෞද්ධ ධර්ම සංගායනා අතර ''සාහස්සිකා'' යන අතිරේක නාමයෙන් හඳුන්වනු ලබන්නේ,

(1) පළමු සංගායනාවයි. (2) දෙවන සංගායනාවයි.

(3) තෙවන සංගායනාවයි. (4) සිව්වන සංගායනාවයි.

(16) මොග්ගලිපුත්තතිස්ස හිමියන්ගේ ප්‍රධානත්වයෙන් පැවති ධර්ම සංගායනාව සඳහා අනුග්‍රහය දැක්වූයේ,

(1) කොසොල් රජතුමා ය. (2) අජාසත් රජතුමා ය.

(3) ධර්මාශෝක රජතුමා ය. (4) කාලාශෝක රජතුමා ය.

(17) අනුනගේ සැපත දුටුවිට ඇතැමුනට නිරායාසයෙන්ම පහළ වන්නේ ඊර්ෂ්‍යා සහගත සිතිවිලි ය. යමෙකු අන්‍යයන්ගේ සැපත හෝ ජයග්‍රහණය දැක අවංකව සතුටු වේ නම් ඔහු තුළ පවතින එකී ගුණාංගය වනුයේ,

(1) මෙත්තාවයි. (2) කරුණාවයි.

(3) මුදිතාවයි. (4) උපේක්ෂාවයි.

(18) සර්ව සත්ත්ව හිතවාදි බෞද්ධ දැක්ම මැනවින් ප්‍රකට කෙරෙන ''සබ්බේ සත්තා භවන්තු සුඛි තත්තා'' යන පාඨය දෙවරක් සඳහන් වන සූත්‍ර දේශනාව වන්නේ,

(1) රතන සූත්‍රයයි. (2) කරණීය මෙත්ත සූත්‍රයයි.

(3) මහා මංගල සූත්‍රයයි. (4) මිත්තානිසංස සූත්‍රයයි.

(19) ගුරුළු ගෝමී පඬිවරයා විසින් රචිත අමාවතුර නම් ග්‍රන්ථයෙහි විස්තර කෙරෙන බුදුගුණය නම්,

(1) අරහං ගුණයයි. (2) සම්මා සම්බුද්ධ ගුණයයි.

(3) සුගත ගුණයයි. (4) පුරිසදම්ම සාරථී ගුණයයි.

(20) බුදුදහමට අනුව මිනිසාට ලබාගත හැකි පරම ලාභය ලෙස පෙන්වා දෙනු ලබන්නේ,

(1) නිරෝගිකමයි. (2) සතුටයි.

(3) ධනයයි. (4) නිවනයි.

(ලකුණු 2 x 20 = 40)

Department of Education – Western Province

## **II කොටස**

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වෙයි.**
- **පළමු ප්‍රශ්නය ඇතුළත්ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20ක් ද අනෙකුත් ප්‍රශ්න හතරට ලකුණු 10 බැගින්ද හිමිවෙයි.**

(01) තෙවන පාසල් වාරයේදී ඔබට නියමිත පාසල් පාදක ඇගයීමට අදාළව පන්ති කාමරයේදී සකස් කරන ලද ''ප්‍රශ්නෝත්තර පොත'' ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) ඔබ සකස් කළ ප්‍රශ්නෝත්තර පොතට යෙදූ නම කුමක් ද?

(2) මෙම පොත සකස් කිරීම සඳහා ඔබ අදාළ කරගත් පෙළ පොතෙහි පාඩම් දෙකක් නම් කරන්න.

(3) කිසියම් කාර්යයක් ආරම්භ කොට ඉදිරියට පවත්වාගෙන යාමේදී පුද්ගලයා පියවර සයක් අනුව ගමන් කළ යුතුය. මේ බව සඳහන් වන සූත්‍ර දේශනාවක් ලියන්න.

(4) එම පියවර සයෙහි පළමු හා දෙවැනි පියවර නම් කරන්න.

(5) අටලෝ දහම පිළිබඳ උගත් ඔබ ඉන් කම්පා නොවී සිටි අවස්ථා දෙකක් පෙන්වා දෙන්න.

(6) දානාදි ප්‍රත්‍ය ලාභීන් අතර අග්‍රගණ්‍ය වූ රහතන් වහන්සේ කවුරුන් ද?

(7) තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව ඇතිවන ආකාරය අනුව ප්‍රභේද දෙකකි. ඒ මොනවා ද?

(8) නිවන් අරමුණු කොට ගෙන මධ්‍යම ප්‍රතිපදාවෙහි ගමන්කරන්නකු විසින් අත්හල යුතු අන්ත දෙක මොනවා ද?

(9) කණ්ඩායමක් ලෙස මෙවැනි කාර්යයක නිරත වීමෙන් ඔබ තුළ වර්ධනය වූ සමාජ ගුණධර්ම දෙකක් ලියන්න.

(10) මෙම ප්‍රශ්නෝත්තර පොත සකස්කිරීමේදී පෙළපොතට අමතරව ඔබ කියවූ ග්‍රන්ථ හෝ පුවත් පත් දෙකක් නම් කරන්න.

(මුළු ලකුණු 2x10 = 20)

Department of Education – Western Province

(02) පින් කැමති බෞද්ධයාට වපුරා අස්වැන්න නෙලාගත හැකි පින්කෙත නම් මහා සංඝ රත්නයයි.

(1) මහා සංඝරත්නය උදෙසා යුතුකම් ඉටුකළ යුතු ආකාරය හඳුන්වාදෙන බෞද්ධ සූත්‍ර දේශනාව කුමක් ද? (ලකුණු 02)

(2) අපගේ ජීවිතයේ විවිධ අවස්ථාවලදී මහා සංඝරත්නයේ සේවය හා ආශිර්වාදය අපට නැතිවම බැරිය. එවැනි අවස්ථා තුනක් ලියන්න. (ලකුණු 03)

(3) ගිහියන් වන අපි විසින් මහා සංඝරත්නය උදෙසා යුතුකම් ඉටුකළ යුතු ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(03) නිර්වාණගාමී ප්‍රතිපදාවෙහි ආරම්භය සීලයයි.

(1) මිනිසා සිල්වත් ජීවිතයකට යොමු කෙරෙන ලෝක පාලක ධර්ම දෙක මොනවා ද? (ලකුණු 02)

(2) අප විසින් නොකළ යුතු, සිතින් සිදුකෙරෙන අකුසල් තුන මොනවා ද? (ලකුණු 03)

(3) ''පන්සිල් සුරකින දරුවා සැමට ප්‍රියවෙයි'' යන මාතෘකාවට අදාලව පන්සිල් සුරැකීමේ අගය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(04) අප විසින් සිදු කරනු ලබන සියලු කර්මයන්ගේ වගකීම අපමම දැරිය යුතුය. එය කිසිවෙකුට පැවරිය නොහැකිය.

(1) කර්මයේ ප්‍රධාන ප්‍රභේද දෙක මොනවා ද? (ලකුණු 02)

(2) තුන්දොරින් සිදුකරනු ලබන අයහපත් ක්‍රියාවලට මුල්වන චේතනා තුන ලියන්න. (ලකුණු 03)

(3) විපාක දෙන කාල අනුව කර්මයේ ප්‍රභේද හඳුන්වා දී කර්ම ඵල විපාක පිළිබඳ විශ්වාසයෙන් යුතුව කටයුතු කිරීම ජීවිතයේ සාර්ථකත්වය සඳහා ඉවහල් වන ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 05)

(05) ථේරවාදී බුදු දහම, එදාසිට අද දක්වා නිර්මලව පවත්වාගෙන ඒම සඳහා ධර්ම සංගායනා මගින් සිදුවූ මෙහෙය අමිලය.

(1) ශ්‍රී ලංකාවට බුදුදහම හඳුන්වා දීම සඳහා හේතු වූ ධර්ම සංගායනාව කුමක් ද? එය පැවැත්වූයේ කොහේ දී ද? (ලකුණු 02)

(2) එම ධර්ම සංගායනාව පැවැත්වීමට බලපෑ ප්‍රධාන හේතුව කුමක් ද? (ලකුණු 03)

(3) බුදුදහම නිර්මලව පවත්වාගෙන ඒම සඳහා මෙම ධර්ම සංගායනාවෙන් ඉටුවූ මෙහෙය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(06) උපයාගත් ධනය විනාශ වීම පුද්ගලයාගේ මෙන්ම සමාජයේ ද ආර්ථික පරිහානියට හේතු වෙයි.

(1) පුද්ගලයෙකුගේ මෙලොව හා පරලොව දියුණුවට හේතු වන කරුණු ඇතුළත් ව්‍යග්ඝපජ්ජ සූත්‍රය දේශනා කළේ කවරෙකු උදෙසා ද? (ලකුණු 02)

(2) 'සමජීවිකතා' යන්නෙහි අර්ථය කුමක් ද? (ලකුණු 03)

(3) ඔබ සතු පෞද්ගලික හා පොදු සම්පත් රැක ගැනීමට ඔබ විසින් කළ හා නොකළ යුතු දේ පිළිබඳව පහදා දෙන්න. (ලකුණු 05)

(07) අපගේ ජීවිතයේ පැන නගින බොහෝ ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් බොහොමයක් ''බෞද්ධයාගේ අත්පොත'' නැමැති ග්‍රන්ථයෙන් ලබාදෙයි.

(1) ''බෞද්ධයාගේ අත්පොත'' ලෙස හැඳින්වෙන එම ග්‍රන්ථය කුමක් ද? (ලකුණු 02)

(2) එහි දැක්වෙන පරිදි ඇසුරු කිරීමට සුදුසු පුද්ගලයකු තෝරාගත නොහැකි විට තනිව වාසය කිරීම සුදුසු බව කියවෙන
චරං චේ නාධිගච්ඡෙය්‍ය..... යන ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 03)

(3) තමාට වඩා ගුණ නුවණ ඇති හෝ තමා හා සමාන ගුණ නුවණ ඇති පුද්ගලයින් ඇසුරු කිරීමෙන් ඔබට ලබාගත හැකි යහපත් ප්‍රතිඵල කිහිපයක් පෙන්වා දෙන්න. (ලකුණු 05)

Department of Education – Western Province